**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ** 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, **විශ්වවිද්‍යාලයේ** මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, **විශ්වවිද්‍යාලය** අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය **විශ්වවිද්‍යාලය** ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා **විශ්වවිද්‍යාලයේ** අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

**විශ්වවිද්‍යාලයේ** මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, **විශ්වවිද්‍යාලයේ** වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ **විශ්වවිද්‍යාලයේ** කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ **විශ්වවිද්‍යාලයේ** පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, **විශ්වවිද්‍යාලය** ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන නිකුත් නොකර ගබඩාවේ පවතින පිරිවැය රු.8,510,955 ක් වූ ප්‍රාග්ධන භාණ්ඩ වර්ග 15 කට අදාළ අයිතම 37 9ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 7 හි 14 ඡේදය අනුව දේපල, පිරියත හා උපකරණ ලෙස හඳුනාගතයුතු වුවද, ඒ වෙනුවට ජංගම වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ දැක්වෙන ජංගම වත්කම් වල පිරිවැය හා ජංගම නොවන | විශ්වවිද්‍යාලයට මිලදී ගන්නා භාණ්ඩ, තොග අත්තිකාරම් ගිණුම හරහා සිදුකරන බවත් අදාළ ප්‍රාග්ධන භාණ්ඩ නිකුත් කිරීමෙන් පසුව ස්ථාවර වත්කම් ලෙස හඳුනා ගන්නා බවත් එතෙක් ක්ෂය වෙන් කිරීම් සිදු කළ නොහැකි බවත් දන්වා තිබුණි. | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| වත්කම් වල පිරිවැය ඊට සමාන අගයකින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දැක්වේ. | | |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබූ රු.118,800,000ක ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම හා මැනීම සිදුකර නොතිබුණි | ඉදිරියේදී අදාළ පරිදි වාර්තා කරන බවට ප්‍රකාශ කර තිබුණි | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 විධිවිධාන වලට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධ වාර්තා කිරීම් කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී මෝටර්රථයක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් වැය කර තිබුණු රු.1,150,500 ක් ප්‍රාග්ධනිත කර තිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ පිරිවැය ඊට සමාන අගයකින් හා වර්ෂයට අදාළ මෝටර් රථ ක්ෂය රු.247,752 කින් වැඩියෙන් දැක්වේ. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ද රු.902,748 කින් වැඩියෙන් දැක්වේ. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලද මෝටර් රථය ධාවන මට්ටමේ නොතිබූ බැවින් අදාළ නියෝජිත ආයතනයට යොමු කර ධාවන තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය අලුත්වැඩියා සිදු කරගත් බවත් මුල් වරට ධාවන තත්ත්වයට පත් කිරීමට දැරූ අදළ මූලික වියදම් ඒ අනුව ප්‍රාග්ධනිත කළ බවත් දන්වා එවා තිබුණි. | ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 570(ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 ඉක්මවූ එකතුව රු.1,240,057 ක රඳවා ගත් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම මුදලින් රු.101,500 ක මුදලක් මේ වන විට නිදහස් කර ඇති බවත් ඉතිරි වටිනාකම 2022 වර්ෂයේදී නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 පෙබරවාරි 16 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මාර්ගගත ඉගැන්වීම්, ඉගැනුම් හා | විශ්වවිද්‍යාලය පිහිටුවා යටිතල පහසුකම් සැපයීමට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු කරන | ලබාදී ඇති මුදල් අදාළ අරමුණ ඉටුකර ගැනීම වෙනුවෙන් උපයෝජනය කළ |

| | | |
|---|---|---|
| ඇගයීම සඳහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් (IT Infrastructure for Online Teaching, Learning and Assessment) සපයා ගැනීම වෙනුවෙන් ලබා දී තිබුණු රු. 10,000,000 ක් 2021 දෙසැම්බර් 31 දින වන විට අදාළ අරමුණ වෙනුවෙන් උපයෝජනය නොකර ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. | තෙක් අදාළ මුදල් කෙටිකාලීනව ආයෝජනය කර ඇති අතර දැනටමත් අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් ඇත. | යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

විශ්වවිද්‍යාලයේ සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.57,234,604 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.45,350,417 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,884,187 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 මාර්තු 01දින සිට විශ්වවිද්‍යාල තත්ත්වයට පත් කර තිබුණු ආයතනය තුළ පීඨ 03ක් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර තිබුණු නමුත් 2021දෙසැම්බර් 31 දින වනවිට පෙර පැවති දේශීය වෛද්‍ය විද්‍යාපීඨය පමණක් ක්‍රියාත්මකව පැවතුණි. නව පීඨ දෙක ආරම්භ කර නොතිබුණද එම පීඨ සඳහා අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා 48 දෙනෙකු 2021 අගෝස්තු මාසය වනවිට බඳවා ගෙන තිබුණු අතර එදින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා වැටුප් හා දීමනා ලෙස එකතුව රු.41,423,070 ක් ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාලයේ පීඨ 4 සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද අධ්‍යන හා අනධ්‍යන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සම්පූර්ණ කර ඇති බවත් 2022 මාර්තු 21 දින සිට මාර්ගගත ක්‍රමයට ඉගැන්වීම් සිදු කරනු ලබන බැවින් ඉගැන්වීම් ආරම්භ කිරීමට පෙර කටයුතු රැසක් සිදු කිරීමට ඇති හෙයින් එම බඳවා ගැනීම් සිදුකළ බවත් දන්වා එවා තිබුණි. | වැටුප් හා දීමනා ගෙවීමේ ඵලදායීතාවයක් ඇති වීම සඳහා පීඨවල අධ්‍යයන කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අරමුදල් 14 ක පැවති එකතුව රු.6,457,008 ක් සමාලෝචිත වර්ෂය තුළ අදාළ අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි. | රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් නිසි පරිදි කටයුතු සිදුකිරීමට නොහැකි වූ අතර 2022 වසරේදී ඊට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් ඇත. | අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා අරමුදල් උපයෝජනය කළ යුතුය. |

**3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සිව්මහල් අධ්‍යයන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු රු.මිලියන 134.5 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට 2014 සැප්තැම්බර් 18 දින ප්‍රදානය කර තිබුණු නමුත් ඇති වූ ආරවුලක් මත 2019 ජූලි 03 වන දින කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණු අතර එදින වන විට වැයවී තිබුණු මුදල රු.මිලියන 114.15 ක් විය. ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් කටයුතු II අදියර ලෙස 2020 දෙසැම්බර් 24 දින නැවත ආරම්භ කර තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ නිම කිරිමට අපොහොසත්වී තිබුණු අතර මෙම ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් උපදේශක සේවා සපයන ආයතනයට රු.4,247,209 ක්ද ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු නිසි පරිදි සිදු කිරීමට අපොහොසත් වීම නිසා දෙපාර්ශ්වයේම එකඟතාව මත ඉදිකිරීම් වලින් ඉවත් කළ බවත් ඊට පසු වෙනත් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු ලවා ඉතිරි ඉදිකිරීම් සිදුකිරීමට කටයුතු කරන ලදී. කොවිඩ් වසංගත තත්ත්වය හා අමුද්‍රව්‍ය හිඟකම මත රටෙහි පැවති අර්බුධකාරී තත්ත්වය නිසා ඉදිකිරීම් කටයුතු 2021 වර්ෂය අවසානයේදී සිදුකිරීමට නොහැකි විය. | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කඩිනමින් නිම කර භාවිතයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |